# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2384/35 - 2024 මැයි මස 17 වැනි සිකුරාදා - 2024.05.17**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත**

1985 අංක 48 දරන සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තිය සහ 14 වන වගන්තිය සමඟ කියවිය යුතු, 20 වන වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය, රනිල් වික්‍රමසිංහ වන මවිසින් සාදනු ලබන රෙගුලාසි.

**රනිල් වික්‍රමසිංහ,**
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති
අමාත්‍ය.

2024 මැයි මස 17 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

**රෙගුලාසි**

1. මෙම රෙගුලාසි **"1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ වන ප්‍රමිතිකරණ හා තත්ත්ව පාලන රෙගුලාසි"** ලෙස හඳුන්වනු ලැබේ.

2. 2018 මාර්තු මස 29 දිනැති අංක 2064/34 දරන **අතිවිශෙෂ ගැසට් පත්‍රයේ** ප්‍රකාශයට පත්කර ඇති 2017 ආනයන හා අපනයන පාලන (ප්‍රමිතිකරණ හා තත්ත්ව පාලන) රෙගුලාසි සහ එහි සංශෝධන, 2024 මැයි මස 16 දින හෝ ඊට පෙර ශ්‍රී ලංකාවේ ඕනෑම නැව්/ ගුවන් තොටුපළක් වෙත ළඟාවන භාණ්ඩ ආනයනවලට අගතියක් නොවන පරිදි මෙයින් පරිච්ජින්න කරනු ලබන අතර මෙම *ගැසට් පත්‍රය* මගින් පනවනු ලබන රෙගුලාසි 2024 මැයි මස 17 දින හෝ ඉන්පසුව ශ්‍රී ලංකාවේ ඕනෑම නැව්/ගුවන් තොටුපළක් වෙත ළඟා වූ **I (අ) උපලේඛනයේ** දක්වා ඇති භාණ්ඩ ආනයනය සඳහා සහ 2024 නොවැම්බර් මස 16 වන දින හෝ ඉන්පසුව ශ්‍රී ලංකාවේ ඕනෑම නැව්/ගුවන් තොටුපළක් වෙත ළඟා වූ **I (ආ) උපලේඛනයේ** දක්වා ඇති භාණ්ඩ ආනයනය සඳහා අදාළ වේ.

3. මෙහි **I (අ)** සහ **I (ආ) උපලේඛනවල** දක්වා ඇති භාණ්ඩ, ඒවාට අනුරූපී **I (අ)** සහ **I (ආ) උපලේඛනවල** IV වන තීරුවේ නියම කර ඇති "ශ්‍රී ලංකා ප්‍රමිතීන්ට" අනුකූල නොවන්නේ නම්, කිසිදු ආනයනකරුවෙකු එම භාණ්ඩ ආනයනය කිරීම සිදු නොකළ යුතුය.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

4. පහත රෙගුලාසි අංක 5 හි සඳහන් ලියකියවිලි මගින් හෝ පහත සඳහන් අංක 6 රෙගුලාසිය ප්‍රකාරව, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් සිදුකරනු ලබන පරීක්ෂණ ප්‍රතිඵල තක්සේරු කිරීම මගින් "ශ්‍රී ලංකා ප්‍රමිතීන්ට" අනුකූල බව සනාථ කරනු ලැබිය යුතුය.

5. මෙහි **I (අ)** සහ **I (ආ) උපලේඛනවල** නිශ්චිතව දක්වා ඇති ඕනෑම භාණ්ඩ ආනයනකරුවෙකු ,එකී උපලේඛනවල දක්වා ඇති අදාළ "ශ්‍රී ලංකා ප්‍රමිතිවලට" අනුකූල බව පෙන්වා දෙමින් සත්‍යාපනය සඳහා පහත සඳහන් පරිදි අවශ්‍ය ලියකියවිලි, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතුය.
   - අ. ස්වාධීන ප්‍රතීතන රසායනාගාරයක් හෝ ස්වාධීන ආයතනයක් විසින් ලබාගත් භාණ්ඩවල සාම්පල විශ්ලේෂණය කිරීමෙන් පසු අපනයනය කරන රටෙහි ස්වාධීන ප්‍රතීතනය ලත් රසායනාගාරයක් විසින් නිකුත් කරන ලද භාණ්ඩ සඳහා නියම කර ඇති "ශ්‍රී ලංකා ප්‍රමිතිය" සමඟ පිළිගත හැකි නිෂ්පාදන අනුකූලතා සහතිකයක් හෝ;
   - ආ. අපනයනය කරන රටෙහි ජාතික ප්‍රමිති ආයතනයෙන් හෝ නිසි බලධාරී ප්‍රමිති අධිකාරියෙන් නිකුත් කරන ලද පිළිගත හැකි නිෂ්පාදන අනුකූලතා සහතිකයක් හෝ;
   - ඇ. අදාළ භාණ්ඩ සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ ලියාපදිංචි කර ඇති විදේශීය නිෂ්පාදකයාගේ නිෂ්පාදනාගාරයෙන් නිකුත් කරන ලද පිළිගත හැකි නිෂ්පාදන අනුකූලතා සහතිකයක් හෝ;
   - ඈ. අදාළ ශ්‍රී ලංකා ප්‍රමිති පිරිවිතරයන්ට අනුකූල වන ප්‍රමිතියක් භාවිතයෙන් සහතිකකරණය කරන ලද වෙනත් ඕනෑම "නිෂ්පාදන සහතික ලකුණක්" හෝ ''එස්. එල්. එස්. (SLS) ලකුණ" සඳහා ඕනෑම රටක ජාතික ප්‍රමිති ආයතනය විසින් නිකුත් කරන ලද සහතිකය / බලපත්‍රය.

6. **I (අ)** සහ **I (ආ) උපලේඛනවල** දක්වා ඇති ඕනෑම භාණ්ඩයක් ආනයනය කරන සෑම ආනයනකරුවෙකුම, ශ්‍රී ලංකා රේගු නිෂ්කාශනයට පෙර ආනයනය කරන ලද භාණ්ඩවලට අදාළ සියලු ලේඛන ශ්‍රී ලංකා රේගු අධ්‍යක්ෂ ජනරාල් සහ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතුය.
අදාළ "ශ්‍රී ලංකා ප්‍රමිතීන්ට" අනුකූලව අවශ්‍ය පරිදි නියැදි පරීක්ෂා කළ යුතුය.

7. ඉහත 6 රෙගුලාසිය ප්‍රකාරව, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයට ඉදිරිපත් කරන ලද නියැදි, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ස්ථාපනය කරන ලද අදාළ අනුකූලතා තක්සේරු කිරීමේ ක්‍රියා පටිපාටි සහ මාර්ගෝපදේශ මත පදනම්ව "ශ්‍රී ලංකා ප්‍රමිතීන්ට" අනුකූලද යන්න පරීක්ෂා කරනු ලැබිය යුතුය.

8. සාමාන්‍ය විධිවිධාන;

   - අ. "ශ්‍රී ලංකා ප්‍රමිතිවලට" අනුකූල නොවන **I (අ)** සහ **I (ආ) උපලේඛනවල** දක්වා ඇති කිසියම් භාණ්ඩයක් ආනයනය කර ඇත්නම්, සියළුම ආශ්‍රිත වියදම් එවැනි භාණ්ඩ ආනයනය කළ ආනයනකරු විසින් දරනු ලැබ, රේගු සටහන්කරයේ (CUSDEC) සඳහන් දිනයේ සිට දින අනූවක් (90) ඇතුළත අපනයනය කරනු ලැබූ රටට ප්‍රති-අපනයනය කළ යුතුය.

   - ආ. රෙගුලාසි අංක 8 (අ) ප්‍රකාරව ප්‍රති-අපනයනය කරන භාණ්ඩ පිළිබඳ විස්තර ඇතුළත් මාසික වාර්තාවක් ශ්‍රී ලංකා රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් ආනයන හා අපනයන පාලක ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතුය.

   - ඇ. **I (අ)** සහ **I (ආ) උපලේඛනවල** දක්වා ඇති කිසියම් භාණ්ඩයක්, විශේෂයෙන් ශ්‍රී ලංකා ප්‍රමිතීන්ට අනුකූලවීම 6 වන රෙගුලාසියට අනුව සාම්පල පරීක්ෂා කිරීම මත රඳා පවතින අවස්ථාවල දී එවැනි භාණ්ඩ නිශ්කාෂණය සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලැබෙන තෙක්, ශ්‍රී ලංකා රේගුව විසින් ආනයනකරුගේ කිසිදු ගබඩාවකට නිදහස් කිරීම නොකළ යුතුය.

   - ඈ. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ "ශ්‍රී ලංකා ප්‍රමිතිවලට" අනුව එම භාණ්ඩවල පිටත ආවරණයේ කිසියම් සලකුණක් තැබීමට යටත්ව, රේගු ආඥාපනතේ 134 වැනි වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ලබන වටිනාකමට සමාන බැංකු ඇපකරයක් යටතේ දින 03ක් ඇතුළත භාණ්ඩ ආනයනකරුගේ ගබඩාවට මුදාහැරිය හැකිය. එවැනි අවස්ථාවක දී, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා අනුකූලතාව පිළිබඳව සෑහීමකට පත්වී එය ලිඛිතව සන්නිවේදනය කළහොත් පමණක් ශ්‍රී ලංකා රේගු අධ්‍යක්ෂ ජනරාල්ට ගබඩාවෙන් එම භාණ්ඩ නිෂ්කාශනය කිරීම සඳහා අනුමැතිය ලබා දිය හැකිය. එසේ නොමැති නම්, රෙගුලාසි අංක 8 (අ) අනුව එවැනි භාණ්ඩ අපනයනය කරන රට වෙත ප්‍රති-අපනයනය කළ යුතුය.

   - ඉ. **I (අ)** සහ **I (ආ) උපලේඛනවල** III වන තීරුවේ දක්වා ඇති ඕනෑම භාණ්ඩයකට ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ අවශ්‍ය අනුමැතිය ඇති බව ශ්‍රී ලංකා රේගුවෙන් භාණ්ඩ නිෂ්කාශනය කිරීමට පෙර සහතික කිරීම අවශ්‍ය වේ.

   - ඊ. **I (අ) උපලේඛනයේ** III වන තීරුවේ අනුක්‍රමික අංක 01 සිට 48 දක්වා සහ **I (ආ) උපලේඛනයේ** III වන තීරුවේ අනුක්‍රමික අංක 128 සිට 131 දක්වා නිශ්චිතව සඳහන් කර ඇති ආහාර ද්‍රව්‍ය ආනයනය කිරීමේදී, ශ්‍රී ලංකා රේගුවෙන් එවැනි භාණ්ඩ නිෂ්කාශනය කිරීම සඳහා 1980 අංක 26 දරන සංශෝධිත ආහාර පනතේ සවිස්තර කර ඇති ප්‍රධාන ආහාර අධිකාරියේ අනුමැතිය මෙන්ම ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ද අනිවාර්යය වේ.

9.

අ. **I (අ) උපලේඛනයේ** III වන තීරුවේ අනුක්‍රමික අංක 49 සිට 127 දක්වා සහ **I (ආ) උපලේඛනයේ** III වන තීරුවේ අනුක්‍රමික අංක 132 සිට 161 දක්වා නිශ්චිතව සඳහන් කර ඇති ආහාර නොවන ද්‍රව්‍ය සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමැතිය ලබා නොදුන්නේ නම්;

ආ. **I (අ) උපලේඛනයේ** III වන තීරුවේ අනුක්‍රමික අංක 01 සිට 48 දක්වා සහ **I (ආ) උපලේඛනයේ** III වන තීරුවේ අනුක්‍රමික අංක 128 සිට 131 දක්වා නිශ්චිතව සඳහන් කර ඇති ආහාර ද්‍රව්‍ය සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් සහ 1980 අංක 26 දරන ආහාර පනත සහ එහි සංශෝධන මගින් සවිස්තර කර ඇති ප්‍රධාන ආහාර අධිකාරිය විසින් අනුමැතිය ලබා නොදුන්නේ නම්;

කිසිදු ආනයනකරුවෙකු මෙම රෙගුලාසි යටතේ ආවරණය වන භාණ්ඩ විකිණීම, විකිණීම සඳහා ඉදිරිපත් කිරීම, භාවිත කිරීම හෝ බෙදා හැරීම සිදු නොකළ යුතුය.

10. "ශ්‍රී ලංකා ප්‍රමිතීන්ට" අනුකූල නොවීම.

අ. නියැදි පරීක්ෂණයේ ප්‍රතිඵලයක් ලෙස **I** (අ) සහ **I** (ආ) **උපලේඛනවල** දක්වා ඇති භාණ්ඩ "ශ්‍රී ලංකා ප්‍රමිතිවලට" අනුකූල නොවන බව ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් සොයාගත් විට, ඒ පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ආනයන හා අපනයන පාලක ජනරාල් වෙත දැනුම්දිය යුතු අතර, අනුකූලතා සහතිකය නිකුත් කර ඇති ප්‍රතීතන රසායනාගාරයට එරෙහිව අවශ්‍ය පියවර ගත යුතුය.

ආ. ආනයනකරු විසින් සපයනු ලබන සහතිකයේ මෙම රෙගුලාසිවල අඩංගු කිසියම් පරමාර්ථයක් උල්ලංඝනය කරමින් ව්‍යාජ තොරතුරු අඩංගු බව පෙනී ගියහොත්, එවැනි සිදුවීමක් ව්‍යාජ තොරතුරු සහිත එම සහතිකය සමඟ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ආනයන හා අපනයන පාලක ජනරාල් සහ රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත දැනුම්දිය යුතුය. එවැනි සාවද්‍ය තොරතුරු සහිත ලියකියවිලි (සහතිකයක්) ලබා දී ඇති ආනයනකරුවට / පාර්ශ්වයට එරෙහිව ශ්‍රී ලංකා රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් රේගු ආඥාපනතේ (235 වන පරිච්ඡේදයේ) විධිවිධාන ප්‍රකාරව පියවර ගත යුතුය.

11. යම් ආනයනකරුවෙකු මෙම රෙගුලාසිවල පරමාර්ථයට එරෙහිව රෙගුලාසිවල විධිවිධාන උල්ලංඝනය කරමින් ක්‍රියා කරන විට, ආනයන හා අපනයන පාලන පනතේ විධිවිධාන අනුව, ආනයන හා අපනයන පාලක ජනරාල් විසින්, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් සහ රේගු අධ්‍යක්ෂ ජනරාල් විමසා එවැනි ආනයනකරුවෙකුට/ පාර්ශවයකට එරෙහිව, කටයුතු කළ යුතුය.

12. මෙම රෙගුලාසිවල අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත, බලපත්‍රලාභී බැංකු වෙත සහ වෙනත් අදාළ ආයතන වෙත "මෙහෙයුම් උපදෙස්" නිකුත් කරනු ලැබිය යුතුය.

13. ජාතික ආර්ථිකයේ අවශ්‍යතාව මත සහ මහජන සෞඛ්‍ය හා ආරක්ෂාව පිළිබඳ පදනම් කරගෙන ආනයන හා අපනයන පාලක ජනරාල්ට රේගු අධ්‍යක්ෂ ජනරාල් විමසා, අවස්ථානුකූලව, ඉහත සඳහන් ඕනෑම රෙගුලාසියක් අදාළ වීමෙන් නිදහස් කිරීමක් ප්‍රදානය කළ හැකිය.

**I (අ) උපලේඛනය**

| *අනුක්‍රමික අංකය* | *II තීරුව*<br>***සංයෝජිත වර්ගීකරණ සංකේතය*** | *III තීරුව*<br>***විෂයයන්*** | *IV තීරුව*<br>***ශ්‍රී ලංකා ප්‍රමිතිය*** |
|---|---|---|---|
| 1 | 0402.10<br>0402.21<br>0402.29 | සම්පූර්ණ යොදය සහිත කිරිපිටි<br>අඩු යොදය සහිත කිරිපිටි<br>යොදය ඉවත් කළ කිරිපිටි | ශ්‍රී ලංකා ප්‍රමිති 731 කිරිපිටි සඳහා ප්‍රමිති පිරිවිතර |
| 2 | 0402.99.10<br>0402.99.90 | උකුකිරි | ශ්‍රී ලංකා ප්‍රමිති 179 පැණි රසකළ සම්පූර්ණ යොදය සහිත උකුකිරි සඳහා ප්‍රමිති පිරිවිතර |
| 3 | 0405.10 | බටර් | ශ්‍රී ලංකා ප්‍රමිති 279 බටර් සඳහා ප්‍රමිති පිරිවිතර |
| 4 | 0405.20<br>0405.90 | කිරි සහිත මේද තැවරුම් | ශ්‍රී ලංකා ප්‍රමිති 1428 කිරි සහිත මේද තැවරුම් සඳහා ප්‍රමිති පිරිවිතර |

| *අනුක්‍රමික අංකය* | *II තීරුව* *සංයෝජිත වර්ගීකරණ සංකේතය* | *III තීරුව* *විෂයයන්* | *IV තීරුව* *ශ්‍රී ලංකා ප්‍රමිතිය* |
|---|---|---|---|
| 5 | 0713.40.12 | පියලි කළු රතු පරිප්පු | ශ්‍රී ලංකා ප්‍රමිති 896 පියලි කළු රතු පරිප්පු සඳහා ප්‍රමිති පිරිවිතර |
| 6 | 0910.30.10<br>0910.30.90 | කහ රෙරසෝම/කුඩු | ශ්‍රී ලංකා ප්‍රමිති 613 කහ රෙරසෝම/කුඩු සඳහා ප්‍රමිති පිරිවිතර |
| 7 | 1507.10<br>1507.90 | සෝයා බෝංචි තෙල් | ශ්‍රී ලංකා ප්‍රමිති 293 සෝයා බෝංචි තෙල් සඳහා ප්‍රමිති පිරිවිතර |
| 8 | 1508.10<br>1508.90 | රටකජු තෙල් | ශ්‍රී ලංකා ප්‍රමිති 947 රටකජු තෙල් සඳහා ප්‍රමිති පිරිවිතර |
| 9 | 1511.10<br>1511.90.20<br>1511.90.90 | පාම් තෙල් | ශ්‍රී ලංකා ප්‍රමිති 720 පාම් තෙල් සඳහා ප්‍රමිති පිරිවිතර |
| 10 | 1511.90.30<br>1511.90.90 | පාම් ඔලෙයින් | ශ්‍රී ලංකා ප්‍රමිති 961 පාම් ඔලෙයින් සඳහා ප්‍රමිති පිරිවිතර |
| 11 | 1511.90.10 | පාම් ස්ටියරින් | ශ්‍රී ලංකා ප්‍රමිති 960 පාම් ස්ටියරින් සඳහා ප්‍රමිති පිරිවිතර |
| 12 | 1512.11<br>1512.19 | සූරියකාන්ත ඇට තෙල් | ශ්‍රී ලංකා ප්‍රමිති 946 සූරිය කාන්ත තෙල් සඳහා ප්‍රමිති පිරිවිතර |
| 13 | 1513.11.11<br>1513.11.19<br>1513.11.21<br>1513.11.29<br>1513.19.10<br>1513.19.90 | පොල් තෙල් | ශ්‍රී ලංකා ප්‍රමිති 32 පොල් තෙල් සඳහා ප්‍රමිති පිරිවිතර |
| 14 | 1513.21<br>1513.29 | පාම් මද තෙල් | ශ්‍රී ලංකා ප්‍රමිති 862 පාම් මද තෙල් සඳහා ප්‍රමිති පිරිවිතර |
| 15 | 1513.21<br>1513.29 | පාම් මද ඔලෙයින් | ශ්‍රී ලංකා ප්‍රමිති 1555 පාම් මද ඔලෙයින් සඳහා ප්‍රමිති පිරිවිතර |
| 16 | 1515.21<br>1515.29 | බඩ ඉරිඟු තෙල් | ශ්‍රී ලංකා ප්‍රමිති 905 බඩ ඉරිඟු තෙල් සඳහා ප්‍රමිති පිරිවිතර |
| 17 | 1515.50 | තල තෙල් | ශ්‍රී ලංකා ප්‍රමිති 231 තල ඇට තෙල් සඳහා ප්‍රමිති පිරිවිතර |
| 18 | 1517.10.30<br>1517.10.90<br>1517.90 | මාගරින් ඇතුළු මේද තැවරුම්, සංයෝජිත මේද තැවරුම් සහ බේකරි නිෂ්පාදන සඳහා වන මේද | ශ්‍රී ලංකා ප්‍රමිති 1427 මේද තැවරුම් හා මිශ්‍රිත මේද තැවරුම් සඳහා ප්‍රමිති පිරිවිතර |

| *අනුක්‍රමික අංකය* | *II තීරුව* **සංයෝජිත වර්ගීකරණ සංකේතය** | *III තීරුව* **විෂයයන්** | *IV තීරුව* **ශ්‍රී ලංකා ප්‍රමිතිය** |
|---|---|---|---|
| 19 | 1604.11<br>1604.12<br>1604.13<br>1604.14<br>1604.15<br>1604.16<br>1604.19 | ටින් මාළු | ශ්‍රී ලංකා ප්‍රමිති 591 ටින් මාළු සඳහා ප්‍රමිති පිරිවිතර |
| 20 | 1604.20 | ටින් මාළු ව්‍යාංජන | ශ්‍රී ලංකා ප්‍රමිති 1106 ටින් මාළු ව්‍යාංජන සඳහා ප්‍රමිති පිරිවිතර |
| 21 | 1701.12.10<br>1701.12.90<br>1701.13<br>1701.14.10<br>1701.14.90<br>1701.91.30<br>1701.91.90<br>1701.99.90 | දුඹුරු සීනි | ශ්‍රී ලංකා ප්‍රමිති 883 දුඹුරු සීනි සඳහා ප්‍රමිති පිරිවිතර |
| 22 | 1701.91.10<br>1701.91.20<br>1701.99.10<br>1701.99.20<br>1701.99.30<br>1701.99.40<br>1701.99.90 | සුදු සීනි හා අයිසින් සීනි | ශ්‍රී ලංකා ප්‍රමිති 191 සුදු සීනි සඳහා ප්‍රමිති පිරිවිතර |
| 23 | 1704.10.10<br>1704.10.90 | චුයින්ගම් හා බබල්ගම් | ශ්‍රී ලංකා ප්‍රමිති 1265 චුයින්ගම් හා බබල්ගම් සඳහා ප්‍රමිති පිරිවිතර |
| 24 | 1704.90.10<br>1704.90.90 | මෘදු කැන්ඩි | ශ්‍රී ලංකා ප්‍රමිති 1575 මෘදු කැන්ඩි සඳහා ප්‍රමිති පිරිවිතර |
| 25 | 1704.90.10<br>1704.90.90 | රළු කැන්ඩි | ශ්‍රී ලංකා ප්‍රමිති 1576 රළු කැන්ඩි සඳහා ප්‍රමිති පිරිවිතර |
| 26 | 1902.11<br>1902.19 | නූඩ්ල්ස්<br>ක්ෂණික නූඩ්ල්ස් | ශ්‍රී ලංකා ප්‍රමිති 420 පැස්ටා නිෂ්පාදන සඳහා ප්‍රමිති පිරිවිතර |
| | 1902.20<br>1902.30 | මැකරෝනි<br>ස්පැගටි<br>ව(ර්)ම්සිලි | ශ්‍රී ලංකා ප්‍රමිති 1534 ක්ෂණික නූඩ්ල්ස් සඳහා ප්‍රමිති පිරිවිතර |
| 27 | 1902.11<br>1902.19<br>1902.20<br>1902.30 | සහල් නූඩ්ල්ස් (සහල් ව(ර්)ම්සිලි) | ශ්‍රී ලංකා ප්‍රමිති 858 සහල් නූඩ්ල්ස් (සහල් ව(ර්)ම්සිලි) සඳහා ප්‍රමිති පිරිවිතර |
| 28 | 1905.31.10<br>1905.31.90 | විස්කෝතු සහ කුකීස් | ශ්‍රී ලංකා ප්‍රමිති 251 විස්කෝතු සහ කුකීස් සඳහා ප්‍රමිති පිරිවිතර |
| 29 | 1905.32.10<br>1905.32.90 | වේෆර්ස් | ශ්‍රී ලංකා ප්‍රමිති 1313 වේෆර්ස් සඳහා ප්‍රමිති පිරිවිතර |

| අනුක්‍රමික අංකය | II තීරුව<br>සංයෝජිත වර්ගීකරණ සංකේතය | III තීරුව<br>විෂයයන් | IV තීරුව<br>ශ්‍රී ලංකා ප්‍රමිතිය |
|---|---|---|---|
| 30 | 2006.00.10<br>2006.00.90<br>2008.20 | ටින් කළ අන්නාසි | ශ්‍රී ලංකා ප්‍රමිති 266 ටින් කළ අන්නාසි සඳහා ප්‍රමිති පිරිවිතර |
| 31 | 2007.10<br>2007.91<br>2007.99 | ජෑම් වර්ග<br>ජෙලි වර්ග<br>මාමලේඩ් වර්ග සහ සංරක්ෂණයන් (දෝසි) වර්ග | ශ්‍රී ලංකා ප්‍රමිති 265 ජෑම්, ජෙලි, මාමලේඩ් සහ සංරක්ෂණයන් සඳහා ප්‍රමිති පිරිවිතර |
| 32 | 2008.99.90 | ටින් කළ අඹ | ශ්‍රී ලංකා ප්‍රමිති 536 ටින් කළ අඹ සඳහා ප්‍රමිති පිරිවිතර |
| 33 | 2009.11.10<br>2009.11.90<br>2009.19<br>2009.29<br>2009.39<br>2009.49<br>2009.50<br>2009.69<br>2009.79<br>2009.81<br>2009.89.10<br>2009.89.90<br>2009.90 | පළතුරු කෝඩියල් සාන්ද්‍රණ<br>පළතුරු ස්කොෂ් සාන්ද්‍රණ<br>පළතුරු සිරප් සාන්ද්‍රණ | ශ්‍රී ලංකා ප්‍රමිති 730 පළතුරු කෝඩියල් සාන්ද්‍රණ, පළතුරු ස්කොෂ් සාන්ද්‍රණ සහ පළතුරු සිරප් සාන්ද්‍රණ සඳහා ප්‍රමිති පිරිවිතර |
| 34 | 2009.12<br>2009.21<br>2009.31<br>2009.41<br>2009.50<br>2009.61<br>2009.71<br>2009.81<br>2009.89.10<br>2009.89.90<br>2009.90 | පළතුරු යුෂ සාන්ද්‍රණ සහ පළතුරු යුෂ නෙක්ටා | ශ්‍රී ලංකා ප්‍රමිති 1328 පළතුරු යුෂ සාන්ද්‍රණ සහ පළතුරු යුෂ නෙක්ටා සඳහා ප්‍රමිති පිරිවිතර |
| 35 | 2009.19<br>2009.29<br>2009.39<br>2009.49<br>2009.50<br>2009.61<br>2009.69<br>2009.79<br>2009.81<br>2009.89.10<br>2009.90 | පළතුරු ස්කොෂ්<br>පළතුරු සිරප්<br>පළතුරු කෝඩියල් | ශ්‍රී ලංකා ප්‍රමිති 214 පළතුරු ස්කොෂ්, පළතුරු සිරප් සහ පළතුරු කෝඩියල් සඳහා ප්‍රමිති පිරිවිතර |

| *අනුක්‍රමික අංකය* | *II තීරුව* **සංයෝජිත වර්ගීකරණ සංකේතය** | *III තීරුව* **විෂයයන්** | *IV තීරුව* **ශ්‍රී ලංකා ප්‍රමිතිය** |
|---|---|---|---|
| 36 | 2103.10 | සෝයා සෝස් | ශ්‍රී ලංකා ප්‍රමිති 1035 සෝයා සෝස් සඳහා ප්‍රමිති පිරිවිතර |
| 37 | 2103.20 | තක්කාලි සෝස් සහ කැට්සප් කැචප් | ශ්‍රී ලංකා ප්‍රමිති 260 තක්කාලි සෝස් සඳහා ප්‍රමිති පිරිවිතර |
| 38 | 2103.90.90 | මිරිස් සෝස් | ශ්‍රී ලංකා ප්‍රමිති 581 මිරිස් සෝස් සඳහා ප්‍රමිති පිරිවිතර |
| 39 | 2105.00 | අයිස් ක්‍රීම් | ශ්‍රී ලංකා ප්‍රමිති 223 අයිස් ක්‍රීම් සඳහා ප්‍රමිති පිරිවිතර |
| 40 | 2105.00 | අයිස් පලම් සහ අධිශීත පාන | ශ්‍රී ලංකා ප්‍රමිති 967 අයිස් පලම් සහ අධිශීත පාන සඳහා ප්‍රමිති පිරිවිතර |
| 41 | 2202.99.61<br>2202.99.69 | කිරි එකතු කරන ලද බීම | ශ්‍රී ලංකා ප්‍රමිති 917 කිරි එකතු කරන ලද බීම සඳහා ප්‍රමිති පිරිවිතර |
| 42 | 2106.90.49<br>2202.10<br>2202.99.30<br>2202.99.40<br>2202.99.91<br>2202.99.99 | කාබනීකෘත නොවන සංස්ලේෂක/කෘතීම රසකළ කෝඩියල් හා බීම වර්ග | ශ්‍රී ලංකා ප්‍රමිති 221 කාබනීකෘත නොවන සංස්ලේෂක/කෘතීම රසකළ කෝඩියල් හා බීම වර්ග සඳහා ප්‍රමිති පිරිවිතර |
| 43 | 2106.90.49<br>2202.10<br>2202.99.30<br>2202.99.51<br>2202.99.59<br>2202.99.70<br>2202.99.91<br>2202.99.99 | පිළිගැන්වීමට සූදානම් පරිදි සකසන ලද පළතුරු බීම | ශ්‍රී ලංකා ප්‍රමිති 729 පිළිගැන්වීමට සූදානම් පරිදි සකසන ලද පළතුරු බීම සඳහා ප්‍රමිති පිරිවිතර |
| 44 | 2201.10.10 | බෝතල් කරන ලද ස්වභාවික ඛණිජ ජලය | ශ්‍රී ලංකා ප්‍රමිති 1038 බෝතල් කරන ලද ස්වභාවික ඛණිජ ජලය සඳහා වන ප්‍රමිති පිරිවිතර |
| 45 | 2201.90.10 | බෝතල් කරන ලද පානීය ජලය | ශ්‍රී ලංකා ප්‍රමිති 894 බෝතල් (ඇසුරුම්) කරන ලද පානීය ජලය සඳහා ප්‍රමිති පිරිවිතර |
| 46 | 2202.10<br>2202.99.30<br>2202.99.91<br>2202.99.99 | 1. කාබනිකෘත රස කළ පැණි බීම<br>2. රස කළ හෝ නොකළ කාබනිකෘත වතුර හෝ සෝඩා වතුර<br>3. රස කළ කැෆේ සහිත බීම | ශ්‍රී ලංකා ප්‍රමිති 183 කාබනිකෘත බීම සඳහා ප්‍රමිති පිරිවිතර |
| 47 | 2501.00 | කෑමට සුදුසු ලුණු (කැට) | ශ්‍රී ලංකා ප්‍රමිති 79 කෑමට සුදුසු ලුණු සඳහා ප්‍රමිති පිරිවිතර (ලුණු කැට ) |
| 48 | 2501.00 | කෑමට සුදුසු ලුණු (කුඩු) | ශ්‍රී ලංකා ප්‍රමිති 80 කෑමට සුදුසු ලුණු සඳහා ප්‍රමිති පිරිවිතර (ලුණු කුඩු ) |
| 49 | 2523.29.20<br>2523.29.30 | සාමාන්‍ය පෝට්ලන්ඩ් සිමෙන්ති | ශ්‍රී ලංකා ප්‍රමිති 107 සාමාන්‍ය පෝට්ලන්ඩ් සිමෙන්ති සඳහා ප්‍රමිති පිරිවිතර |
| 50 | 2523.29.20<br>2523.29.30 | පෝට්ලන්ඩ් ලයිම්ස්ටෝන් සිමෙන්ති | ශ්‍රී ලංකා ප්‍රමිති 1253 පෝට්ලන්ඩ් ලයිම්ස්ටෝන් සිමෙන්ති සඳහා ප්‍රමිති පිරිවිතර |

| *අනුක්‍රමික අංකය* | *II තීරුව* ***සංයෝජිත වර්ගීකරණ සංකේතය*** | *III තීරුව* ***විෂයයන්*** | *IV තීරුව* ***ශ්‍රී ලංකා ප්‍රමිතිය*** |
|---|---|---|---|
| 51 | 2523.29.20<br>2523.29.30 | පෙදරේරු සිමෙන්ති | ශ්‍රී ලංකා ප්‍රමිති 515 පෙදරේරු සිමෙන්ති සඳහා ප්‍රමිති පිරිවිතර |
| 52 | 2523.29.20<br>2523.29.30 | හයිඩ්‍රොලික් බ්ලෙන්ඩඩ් සිමෙන්ති | ශ්‍රී ලංකා ප්‍රමිති 1247 හයිඩ්‍රොලික් බ්ලෙන්ඩඩ් සිමෙන්ති සඳහා ප්‍රමිති පිරිවිතර |
| 53 | 2711.19.10 | ද්‍රවීකෘත පෙට්රෝලියම් වායුව | ශ්‍රී ලංකා ප්‍රමිති 712 ද්‍රවීකෘත පෙට්රෝලියම් වායුව සඳහා ප්‍රමිති පිරිවිතර |
| 54 | 3303.00.21 | ළදරුවන් සඳහා වන කොලෝන් | ශ්‍රී ලංකා ප්‍රමිති 589 ළදරුවන් සඳහා වන කොලෝන් සඳහා ප්‍රමිති පිරිවිතර |
| 55 | 3304.91 | ළදරුවන්ගේ සම මත ගල්වන පුයර | ශ්‍රී ලංකා ප්‍රමිති 187 ළදරුවන්ගේ සම මත ගල්වන පුයර සඳහා ප්‍රමිති පිරිවිතර |
| 56 | 3306.10 | දන්තාලේප | ශ්‍රී ලංකා ප්‍රමිති 275 දන්තාලේප සඳහා ප්‍රමිති පිරිවිතර |
| 57 | 3401.11.30 | ළදරු සබන් | ශ්‍රී ලංකා ප්‍රමිති 547 ළදරු සබන් සඳහා ප්‍රමිති පිරිවිතර |
| 58 | 3401.11.30<br>3401.11.90 | ඇඟ ගල්වන සබන් | ශ්‍රී ලංකා ප්‍රමිති 34 ඇඟ ගල්වන සබන් සඳහා ප්‍රමිති පිරිවිතර |
| 59 | 3401.11.90 | බේදින් බාර් | ශ්‍රී ලංකා ප්‍රමිති 1220 බේදින්බාර් සඳහා ප්‍රමිති පිරිවිතර |
| 60 | 3401.19.30<br>3401.19.90 | රෙදි සෝදන සබන් | ශ්‍රී ලංකා ප්‍රමිති 554 රෙදි සෝදන සබන් සඳහා ප්‍රමිති පිරිවිතර |
| 61 | 3401.20.90 | රෙදි සේදීමට ගන්නා සබන් කුඩු, පෙති හා පතුරු | ශ්‍රී ලංකා ප්‍රමිති 38 රෙදි සේදීමට ගන්නා සබන් කුඩු, පෙති හා පතුරු සඳහා ප්‍රමිති පිරිවිතර |
| 62 | 3402.50<br>3402.90.10 | රෙදි සේදීමට ගන්නා කෘතිම ක්ෂාලක කුඩු | ශ්‍රී ලංකා ප්‍රමිති 760 රෙදි සේදීමට ගන්නා කෘතිම ක්ෂාලක කුඩු සඳහා ප්‍රමිති පිරිවිතර |
| 63 | 3605.00 | ආරක්ෂිත ගිනි කූරු | ශ්‍රී ලංකා ප්‍රමිති 11 ආරක්ෂිත ගිනි පෙට්ටි සඳහා ප්‍රමිති පිරිවිතර |
| 64 | 3808.59.10<br>3808.61.10<br>3808.62.10<br>3808.69.10<br>3808.91.10 | මදුරු දඟර | ශ්‍රී ලංකා ප්‍රමිති 453 මදුරු දඟර සඳහා ප්‍රමිති පිරිවිතර |
| 65 | 3808.59.91<br>3808.61.20<br>3808.62.20<br>3808.69.90<br>3808.91.30<br>3808.91.90 | මදුරු නාශක පෙති (මැට්ස්) | ශ්‍රී ලංකා ප්‍රමිති 930 මදුරු නාශක පෙති (මැට්ස්) සඳහා ප්‍රමිති පිරිවිතර |
| 66 | 3916.10<br>3916.20<br>3916.90<br>3926.90.99 | පරිවාර ද්‍රව්‍ය වලින් (ආවරණය) සෑදූ කේබල් ට්‍රන්කින් | ශ්‍රී ලංකා ප්‍රමිති 1206 පරිවාරක ද්‍රවයෙන් සෑදූ කේබල් ට්‍රන්කින් සඳහා ප්‍රමිති පිරිවිතර |

| අනුක්‍රමික අංකය | II තීරුව<br>සංයෝජිත වර්ගීකරණ සංකේතය | III තීරුව<br>විෂයයන් | IV තීරුව<br>ශ්‍රී ලංකා ප්‍රමිතිය |
|---|---|---|---|
| 67 | 3916.10<br>3916.20<br>3917.23<br>3917.32<br>3917.39.90<br>3917.40 | විදුලි පිහිටුවීම් සඳහා නායිනි (කොන්ඩියුට්) | ශ්‍රී ලංකා ප්‍රමිති 993 විදුලි පිහිටුවීම්හි නායිනි සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති පිරිවිතර<br>1 වන කොටස - සාමාන්‍ය අවශ්‍යතා<br>2 වන කොටස - පරිවාරක ද්‍රව්‍යයෙන් තැනූ දෘඪ පැතලි නායිනි<br>3 වන කොටස - පරිවාරක ද්‍රව්‍යයෙන් තැනූ පහසුවෙන් තැනූ නායිනි<br>4 වන කොටස - නම්‍යශීලී නායිනි පද්ධති |
| 68 | 3917.23 | ජලය සැපයීමට සහ පොළව යට සහ පොළව මතුපිට ජලා ප්‍රවාහනය හා පීඩනයට යටත්ව මළ ප්‍රවාහනය සඳහා වන සුවිකාර්ය නොවන පොලි වයනයිලඩ් ක්ලෝරයිඩ් පයිප්ප (පීවීසී - යු පයිප්ප) | ශ්‍රී ලංකා ප්‍රමිති 147 ජලය සැපයීමට සහ පොළව යට සහ පොළව මතුපිට ජලා ප්‍රවාහනය හා පීඩනයට යටත්ව මළ ප්‍රවාහනය සඳහා වන සුවිකාර්ය නොවන පොලි (වයනයිලඩ් ක්ලෝරයිඩ්) පයිප්ප සඳහා ප්‍රමිති පිරිවිතර |
| 69 | 3917.23 | ගොඩනැගිලි ඇතුලත පාංශු හා අපද්‍රව්‍ය මුදාහැරීමේ ක්‍රම සඳහා වන සුවිකාර්ය නොවන පොලි වයනයිලඩ් ක්ලෝරයිඩ් පයිප්ප (පීවීසී - යු පයිප්ප) | ශ්‍රී ලංකා ප්‍රමිති 1325 ගොඩනැගිලි ඇතුලත පාංශු හා අපද්‍රව්‍ය මුදාහැරීමේ ක්‍රම සඳහා වන සුවිකාර්ය නොවන පොලි (වයනයිලඩ් ක්ලෝරයිඩ්) පයිප්ප (පීවීසී - යු පයිප්ප) සඳහා ප්‍රමිති පිරිවිතර |
| 70 | 3917.31.10<br>3917.39.10<br>4009.21.10<br>4009.22.10<br>4009.31.10<br>4009.32.10<br>4009.41.10<br>4009.42.10<br>8307.10.10<br>8307.90.10 | ද්‍රවීකෘත පෙට්‍රෝලියම් වායුව සඳහා සොඩනල සහ සොඩනල එකලාසයන් | ශ්‍රී ලංකා ප්‍රමිති 1171 ද්‍රවීකෘත පෙට්‍රෝලියම් වායුව සඳහා සොඩනල සහ සොඩනල එකලාසයන් සඳහා ප්‍රමිති පිරිවිතර |
| 71 | 3917.40.90 | පානීය සිසිල් ජල සැපයුම් සඳහා වන සුවිකාර්ය නොවන පොලි වයිනයිල් ක්ලෝරයිඩ් පයිප්ප (පීවීසී - යු පයිප්ප) සන්ධීන් සහ සවි කුරු | ශ්‍රී ලංකා ප්‍රමිති 659 පානීය සිසිල් ජල සැපයුම් සඳහා වන සුවිකාර්ය නොවන පොලි (වයිනයිල් ක්ලෝරයිඩ්) පයිප්ප (පීවීසී - යු පයිප්ප) සන්ධීන් සහ සවි කුරු සඳහා ප්‍රමිති පිරිවිතර |
| 72 | 3917.40.90 | ගොඩනැගිලි ඇතුලත පාංශු හා අපද්‍රව්‍ය මුදාහැරීමේ ක්‍රම සඳහා වන සුවිකාර්ය නොවන පොලි වයනයිලඩ් ක්ලෝරයිඩ් පයිප්ප (පීවීසී - යු පයිප්ප) උපාංග | ශ්‍රී ලංකා ප්‍රමිති 1325 ගොඩනැගිලි ඇතුලත පාංශු හා අපද්‍රව්‍ය මුදාහැරීමේ ක්‍රම සඳහා වන සුවිකාර්ය නොවන පොලි (වයනයිලඩ් ක්ලෝරයිඩ්) පයිප්ප (පීවීසී - යු පයිප්ප) උපාංග සඳහා ප්‍රමිති පිරිවිතර |
| 73 | 3925.10<br>3925.90 | පොලිඑතිලීන් ජල ගබඩා ටැංකි | ශ්‍රී ලංකා ප්‍රමිති 1174 පොලිඑතිලීන් ජල ගබඩා ටැංකි සඳහා ප්‍රමිති පිරිවිතර |
| 74 | 4011.40<br>4011.90.90 | යතුරු පැදි හා ස්කූටර් ටයර් | ශ්‍රී ලංකා ප්‍රමිති 890 යතුරුපැදි හා ස්කූටර් සඳහා ප්‍රමිති පිරිවිතර |
| 75 | 4011.50 | පාපැදි ටයර් | ශ්‍රී ලංකා ප්‍රමිති 224 පාපැදි ටයර් සඳහා ප්‍රමිති පිරිවිතර |
| 76 | 4013.20 | පාපැදි ටියුබ් වර්ග | ශ්‍රී ලංකා ප්‍රමිති 127 පාපැදි ටියුබ් වර්ග සඳහා ප්‍රමිති පිරිවිතර |
| 77 | 4820.20 | අභ්‍යාස පොත් | ශ්‍රී ලංකා ප්‍රමිති 382 අභ්‍යාස පොත් සඳහා ප්‍රමිති පිරිවිතර |

| *අනුක්‍රමික අංකය* | *II තීරුව*<br>*සංයෝජිත වර්ගීකරණ සංකේතය* | *III තීරුව*<br>*විෂයයන්* | *IV තීරුව*<br>*ශ්‍රී ලංකා ප්‍රමිතිය* |
|---|---|---|---|
| 78 | 5204.11<br>5204.19<br>5204.20 | කපු මැසීමට ගන්නා නූල් | ශ්‍රී ලංකා ප්‍රමිති 112 කපු මැසීමට ගන්නා නූල් සඳහා ප්‍රමිති පිරිවිතර |
| 79 | 5508.10<br>5508.20 | කටින ලද පොලියෙස්ටර් මැහුම් නූල් | ශ්‍රී ලංකා ප්‍රමිති 757 කටින ලද පොලියෙස්ටර් මැහුම් නූල් සඳහා ප්‍රමිති පිරිවිතර |
| 80 | 6506.10.20<br>6506.10.30 | වාහන පාවිච්චි කරන්නන් සඳහා ආරක්ෂක හිස් වැසුම් | ශ්‍රී ලංකා ප්‍රමිති 517 වාහන පාවිච්චි කරන්නන් සඳහා ආරක්ෂක හිස්වැසුම් සඳහා ප්‍රමිති පිරිවිතර |
| 81 | 6601.91<br>6601.99 | කුඩ (නොනමන සහ නමන) | ශ්‍රී ලංකා ප්‍රමිති 1207 කුඩ සඳහා ප්‍රමිති පිරිවිතර<br>1 වන කොටස - නොනමන කුඩ<br>2 වන කොටස - නමන කුඩ |
| 82 | 6810.11.90<br>6810.19 | සිමෙන්ති ටයිල් | ශ්‍රී ලංකා ප්‍රමිති 863 සිමෙන්ති ටයිල් සඳහා ප්‍රමිති පිරිවිතර |
| 83 | 6811.40.10 | රැලි සහිත ඇස්බෙස්ටෝස් තහඩු | ශ්‍රී ලංකා ප්‍රමිති 9 ඇස්බෙස්ටෝස් තහඩු සඳහා ප්‍රමිති පිරිවිතර 2 වන කොටස - රැලි තහඩු |
| 84 | 6811.40.20 | පැතලි ඇස්බෙස්ටෝස් තහඩු | ශ්‍රී ලංකා ප්‍රමිති 9 ඇස්බෙස්ටෝස් තහඩු සඳහා ප්‍රමිති පිරිවිතර 1 වන කොටස - පැතලි තහඩු |
| 85 | 6905.10 | සෙවිලි උළු | ශ්‍රී ලංකා ප්‍රමිති 2 වහල ඇතිරීම සඳහා භාවිතා කරන මැටි සෙවිලි උළු සඳහා ප්‍රමිති පිරිවිතර |
| 86 | 6907.21.10<br>6907.21.90<br>6907.22.10<br>6907.22.90<br>6907.23.10<br>6907.23.90<br>6907.30<br>6907.40 | සෙරමික් ටයිල් හා පෝසිලේන් ටයිල් | ශ්‍රී ලංකා ප්‍රමිති 1181 සෙරමික් ටයිල් සඳහා ප්‍රමිති පිරිවිතර |
| 87 | 6911.10<br>6912.00.10 | පෝසිලේන් හා සෙරමික් පිඟන් භාණ්ඩ | ශ්‍රී ලංකා ප්‍රමිති 1222 පෝසිලේන් පිඟන් භාණ්ඩ සඳහා ප්‍රමිති පිරිවිතර |
| 88 | 7213.10.10<br>7213.10.90<br>7214.20.10<br>7214.20.90<br>7215.50 | කොන්ක්‍රීට් වැරගැන්වීම් සඳහා යොදන නාරටි සහිත වානේ දඬු | ශ්‍රී ලංකා ප්‍රමිති 375 කොන්ක්‍රීට් වැරගැන්වීම් සඳහා යොදන නාරටි සහිත වානේ දඬු සඳහා ප්‍රමිති පිරිවිතර |
| 89 | 7213.91.10<br>7213.91.90<br>7213.99<br>7214.10.90<br>7214.91.10<br>7214.91.20<br>7214.99<br>7215.50<br>7215.90<br>7227.90 | කොන්ක්‍රීට් වැර ගැන්වීම් සඳහා යොදන ප්ලේන් (නාරටි රහිත) වානේ දඬු හා වානේ දඟර | ශ්‍රී ලංකා ප්‍රමිති 26 කොන්ක්‍රීට් වැරගැන්වීම් සඳහා යොදන ප්ලේන් (නාරටි රහිත) වානේ දඬු සඳහා ප්‍රමිති පිරිවිතර |

| අනුක්‍රමික අංකය | II තීරුව<br>සංයෝජිත වර්ගීකරණ සංකේතය | III තීරුව<br>විෂයයන් | IV තීරුව<br>ශ්‍රී ලංකා ප්‍රමිතිය |
|---|---|---|---|
| 90 | 7213.91.10<br>7213.91.90<br>7213.99<br>7214.10.10<br>7214.10.90<br>7214.91.10<br>7214.91.20<br>7214.91.90<br>7214.99<br>7215.50<br>7227.90 | දැඩි උෂ්ණත්වයක් යටතේ රෝල්කර සෑදූ වානේ දඬු<br>i) රවුම් දඬු<br>ii) හතරැස් දඬු<br>iii) පැතලි දඬු | ශ්‍රී ලංකා ප්‍රමිති 949 සාමාන්‍ය ඉංජිනේරු කාර්යයන් සඳහා හා ව්‍යුහ (රාමු) තැනීම පිණිස දැඩි උෂ්ණත්වයක් යටතේ රෝල්කළ වානේ සඳහා ප්‍රමිති පිරිවිතර<br>1 වන කොටස - රවුම් දඬු<br>2 වන කොටස - හතරැස් දඬු<br>5 වන කොටස - පැතලි දඬු |
| 91 | 7216.10<br>7216.21<br>7216.22<br>7216.31<br>7216.40<br>7216.50 | දැඩි උෂ්ණත්වයක් යටතේ රෝල් කළ ව්‍යුහමය වානේ හරස්කඩ<br>i) U හරස්කඩ<br>ii) L හරස්කඩ<br>iii) T හරස්කඩ | ශ්‍රී ලංකා ප්‍රමිති 907 දැඩි උෂ්ණත්වයක් යටතේ රොල් කළ ව්‍යුහමය වානේ හරස්කඩ සඳහා ප්‍රමිති පිරිවිතර<br>3 වන කොටස U හරස්කඩ<br>4 වන කොටස L හරස්කඩ<br>5 වන කොටස T හරස්කඩ |
| 92 | 7217.10<br>7217.20.10<br>7217.20.20<br>7217.20.90 | මෘදු වානේ කම්බි | ශ්‍රී ලංකා ප්‍රමිති 139 සාමාන්‍ය ඉංජිනේරු කාර්යයන් සඳහා වන මෘදු වානේ කම්බි සඳහා ප්‍රමිති පිරිවිතර |
| 93 | 7217.20.20<br>7217.20.90 | කම්බි ඇණ තැනීම සඳහා වන අඩු උෂ්ණත්වයක් යටතේ අදින ලද මෘදු වානේ කම්බි | ශ්‍රී ලංකා ප්‍රමිති 7 කම්බි ඇණ තැනීම සඳහා වන අඩු උෂ්ණත්වයක් යටතේ අදින ලද මෘදු වානේ කම්බි සඳහා ප්‍රමිති පිරිවිතර |
| 94 | 7304.31.10<br>7304.31.90<br>7304.39.10<br>7304.39.90<br>7304.51.10<br>7304.51.90<br>7304.59.10<br>7304.59.90<br>7304.90.10<br>7304.90.90<br>7306.30<br>7306.90.90<br>7307.11<br>7307.19<br>7307.93<br>7307.99 | ගැල්වනයිස් කරන ලද වානේ පයිප්ප හා උපාංග | ශ්‍රී ලංකා ප්‍රමිති 829 ගැල්වනයිනස් කරන ලද වානේ පයිප්ප හා උපාංග සඳහා ප්‍රමිති පිරිවිතර |

| අනුක්‍රමික අංකය | II තීරුව **සංයෝජිත වර්ගීකරණ සංකේතය** | III තීරුව **විෂයයන්** | IV තීරුව **ශ්‍රී ලංකා ප්‍රමිතිය** |
|---|---|---|---|
| 95 | 7311.00 | ප්‍රවාහනය කළ හැකි වෙල්ඩින් කරන ලද වානේ වායු බහාලුම් (ගෑස් සිලින්ඩර්) | ශ්‍රී ලංකා ප්‍රමිති 1178 ද්‍රවිකෘත පෙට්‍රෝලියම් වායුව සඳහා වන ලීටර් 0.5 සිට ලීටර් 150 දක්වා ජල පරිමාවක් සහිත ප්‍රවාහනය කළ හැකි පාස්සන ලද වානේ වායු බහාලුම් සඳහා ප්‍රමිති පිරිවිතර<br><br>ශ්‍රී ලංකා ප්‍රමිති 1303 ද්‍රවිකෘත පෙට්‍රෝලියම් වායුව සඳහා වන ප්‍රවාහනය කළ හැකි නැවත පිරවිය හැකි පිත්තලෙන් පාස්සන ලද වානේ වායු බහාලුම් සඳහා ප්‍රමිති පිරිවිතර |
| 96 | 7314.20<br>7314.31<br>7314.39<br>7314.41<br>7314.42<br>7314.49 | ගැල්වනික හා ප්ලාස්ටික් වලින් ආවරණය කරන ලද කම්බි දැල් | ශ්‍රී ලංකා ප්‍රමිති 1148 වැටවල් සඳහා යොදාගන්නා ගැල්වනික හා ප්ලාස්ටික් වලින් ආවරණය කරන ලද කම්බි දැල් සඳහා ප්‍රමිති පිරිවිතර |
| 97 | 7320.10 | මොටර් රථ අවලම්බන සඳහා වූ දුනු කොළ | ශ්‍රී ලංකා ප්‍රමිති 639 මොටර් රථ අවලම්බන සඳහා වූ දුනු කොළ සඳහා ප්‍රමිති පිරිවිතර |
| 98 | 7408.11<br>7408.19 | පරිවරණය කරන ලද විදුලි කේබල සහ රැහැන් සඳහා වන සන්නායක | ශ්‍රී ලංකා ප්‍රමිති 695 පරිවරණය කරන ලද විදුලි කේබල සහ රැහැන් සඳහා වන සන්නායක සඳහා පිරිවිතර |
| 99 | 7615.10.90 | ඇලුමිනියම් වලින් නිෂ්පාදිත ගේ දොර පරිහරණය කරන භාජන (මේස උපකරණ හා මුළුතැන්ගේ උපකරණ ) | ශ්‍රී ලංකා ප්‍රමිති 69 ඇල්මිනියම් වලින් නිෂ්පාදිත ගේ දොර පරිහරණය කරන භාජන සඳහා ප්‍රමිති පිරිවිතර |
| 100 | 8414.51 | විදුලි පංකා සහ යාමක | ශ්‍රී ලංකා ප්‍රමිති 814 විදුලිපංකා සහ යාමක සඳහා ප්‍රමිති පිරිවිතර |
| 101 | 8481.10.10 | ද්‍රවිකෘත පෙට්‍රෝලියම් වායු සිලින්ඩර සමග භාවිතයට ගන්නා කපාට සවිකුරු | ශ්‍රී ලංකා ප්‍රමිති 1184 ද්‍රවිකෘත පෙට්‍රෝලියම් වායු සිලින්ඩර සමග භාවිතයට ගන්නා කපාට සවිකුරු සඳහා ප්‍රමිති පිරිවිතර |
| 102 | 8481.10.20 | ද්‍රවිකෘත පෙට්‍රෝලියම් වායුව සඳහා යාමකයන් සහ ස්වයංක්‍රීය මාරු උපක්‍රමිකයන් | ශ්‍රී ලංකා ප්‍රමිති 1180 ද්‍රවිකෘත පෙට්‍රෝලියම් වායුව සඳහා යාමකයන් සහ ස්වයංක්‍රීය මාරු උපක්‍රමිකයන් සඳහා ප්‍රමිති පිරිවිතර |
| 103 | 8504.10.10<br>8504.10.90 | බටවන් ප්‍රතිදීපන පහන් සඳහා වන තුලබරු | ශ්‍රී ලංකා ප්‍රමිති 1150 බටවන් ප්‍රතිදීපන පහන් සඳහා වන තුලබරු පිළබඳ ප්‍රමිති පිරිවිතර |
| 104 | 8506.10.10<br>8506.10.90<br>8506.80 | ප්‍රාථමික කෝෂ සහ බැටරි | ශ්‍රී ලංකා ප්‍රමිති 1198 ප්‍රාථමික කෝෂ සහ බැටරි සඳහා ප්‍රමිති පිරිවිතර |
| 105 | 8507.10.10<br>8507.10.90 | ඊයම් අම්ල ආරම්භක විද්‍යුත් කෝෂ | ශ්‍රී ලංකා ප්‍රමිති 1126 ඊයම් අම්ල ආරම්භක විද්‍යුත් කෝෂ සඳහා ප්‍රමිති පිරිවිතර |
| 106 | 8516.10 | ජලය උණු කිරීම සඳහා භාවිත ගිල්වීමේ විදුලි ජලතාපක | ශ්‍රී ලංකා ප්‍රමිති 1193 ජලය උණු කිරීම සඳහා භාවිත ගිල්වීමේ විදුලි ජලතාපක සඳහා ප්‍රමිති පිරිවිතර |
| 107 | 8516.60.90 | විදුලි තාප තැටි | ශ්‍රී ලංකා ප්‍රමිති 1495 විදුලි යමැස්ස, ටෝස්ටර සහ එවැනි අතේ ගෙන යා හැකි පිසුම් උපකරණ සඳහා ප්‍රමිති පිරිවිතර |

| අනුක්‍රමික අංකය | II තීරුව<br>සංයෝජිත වර්ගීකරණ සංකේතය | III තීරුව<br>විෂයයන් | IV තීරුව<br>ශ්‍රී ලංකා ප්‍රමිතිය |
|---|---|---|---|
| 108 | 8516.79.20 | විදුලි කේතල් | ශ්‍රී ලංකා ප්‍රමිති 1501 දියර උණුකිරීම සඳහා වන ගෘහස්ථ හා එවැනි විදුලි උපකරණ සඳහා ප්‍රමිති පිරිවිතර |
| 109 | 8536.20 | ගෘහස්ථ හා ඒ හා සමාන පිහිටුවුම් සඳහා අධිධාරාවන්ගෙන් ආරක්ෂාවීම සඳහා වන පරිපථ බිඳින (MCB) | ශ්‍රී ලංකා ප්‍රමිති 1175 ගෘහස්ථ හා ඒ හා සමාන පිහිටුවුම් සඳහා අධිධාරාවන්ගෙන් ආරක්ෂාවීම සඳහා වන පරිපථ බිඳින සඳහා ප්‍රමිති පිරිවිතර |
| 110 | 8536.20 | ගෘහස්ථ හා ඒ හා සමාන පිහිටුවුම් සඳහා ආරක්ෂණ ලෙස යොදා ගන්නා ක්‍රියාකරවන ශේෂ ධාරා පරිපථ බිඳින (RCCB) | ශ්‍රී ලංකා ප්‍රමිති 1099 ගෘහස්ථ හා ඒ හා සමාන පිහිටුවුම් සඳහා ආරක්ෂණ සඳහා යොදා ගන්නා ක්‍රියාකරවන ශේෂ ධාරා පරිපථ බිඳින (RCCB) සඳහා ප්‍රමිති පිරිවිතර |
| 111 | 8536.20 | ගෘහස්ථ හා ඒ හා සමාන අවශ්‍යතා සඳහා ආරක්ෂණ ලෙස යොදා ගන්නා අනුකල අධිධාරා ආරක්ෂණ සහිත ශේෂ ධාරා ක්‍රියාකරවන පරිපථ බිඳින (RCBO) | ශ්‍රී ලංකා ප්‍රමිති 1022 ගෘහස්ථ හා ඒ හා සමාන අවශ්‍යතා සඳහා ආරක්ෂණ ලෙස යොදා ගන්නා අනුකල අධිධාරා ආරක්ෂණ සහිත ශේෂ ධාරා ක්‍රියාකරවන පරිපථ බිඳින සඳහා ප්‍රමිති පිරිවිතර |
| 112 | 8536.50.10 | බටවත් ප්‍රතිදීපනපහන් සඳහා වන දිළියුම් ආරම්භක | ශ්‍රී ලංකා ප්‍රමිති 1260 බටවත් ප්‍රතිදීපන පහන් සඳහා වන දිළියුම් ආරම්භක සඳහා ප්‍රමිති පිරිවිතර |
| 113 | 8536.50.30<br>8536.50.90 | ගෘහස්ථ සහ ඒ හා සමාන විදුලි පිහිටුවුම් සඳහා ස්විච් | ශ්‍රී ලංකා ප්‍රමිති 1000 ගෘහස්ථ සහ ඒ හා සමාන විදුලි පිහිටුවුම් සඳහා පාවිච්චි කරන ස්විච් සඳහා ප්‍රමිති පිරිවිතර |
| 114 | 8536.61.90 | පරිවෘත බයිනේත්තු ලාම්පු අල්ලු | ශ්‍රී ලංකා ප්‍රමිති 138 පරිවෘත බයිනේත්තු ලාම්පු අල්ලු සඳහා ප්‍රමිති පිරිවිතර |
| 115 | 8536.69.21 | ජාත්‍යන්තර විද්‍යුත් තාක්ෂණ කොමිසම (IEC) විසින් නිර්වචනය කරන ලද G වර්ගයේ ඇම්පියර 13 ජේනු සහ කෙවෙනි -පිටවාන්, විදුලි මෝටර් රථ ආරෝපනය සඳහා වන ජේනු සහ කෙවෙනි ඇතුළත්ව, කෙවෙනිපිටවාන්, බහු කෙවෙනි, ඇඩප්ටර්ස්, විලායික සහිත සම්බන්ධීකාරක ඒකක සහ විලායික සහිත පරිවර්ථක ජේනු ආදිය | ශ්‍රී ලංකා ප්‍රමිති 734 ඇම්පියර 13 ජේනු, කෙවෙනි පිටවාන් සහ ඇඩප්ටර් සහ සම්බන්ධිකාරක ඒකක සඳහා ප්‍රමිති පිරිවිතර |
| 116 | 8539.22.20<br>8539.22.90 | ගෘහස්ථ සහ ඒ හා සමාන පොදු ආලෝකන කාර්යයන් සඳහා වන ටංග්ස්ටන් සූත්‍රිකා ලාම්පු | ශ්‍රී ලංකා ප්‍රමිති 984 ගෘහස්ථ සහ ඒ හා සමාන පොදු ආලෝකන කාර්යයන් සඳහා වන ටංග්ස්ටන් සූත්‍රිකා ලාම්පු සඳහා ප්‍රමිති පිරිවිතර |
| 117 | 8539.31.10 | සාමාන්‍ය ආලෝකකරණය සඳහා ස්වයං බැලාස්ට් ලාම්පු (CFL) | ශ්‍රී ලංකා ප්‍රමිති 1231 සාමාන්‍ය ආලෝකකරණ සේවා සඳහා ස්වයං බැලාස්ට් සහිත ලාම්පු (පූර්ණ ආකාරයේ සංයුක්ත ප්‍රතිදීපන ලාම්පු) සඳහා ප්‍රමිති පිරිවිතර |

| අනුක්‍රමික අංකය | II තීරුව<br>සංයෝජිත වර්ගීකරණ සංකේතය | III තීරුව<br>විෂයයන් | IV තීරුව<br>ශ්‍රී ලංකා ප්‍රමිතිය |
|---|---|---|---|
| 118 | 8544.42.91 | දිගු රැහැන් / අතේ ගෙන යා හැකි කෙවෙනි පිටවාන්, නම්‍යශීලී කේබලයකින් සවි කර ඇති නැවත රැහැන්ගත කළ හැකි සහ නැවත රැහැන්ගත කළ නොහැකි ඇම්පියර 13 G වර්ගයේ පේනු | ශ්‍රී ලංකා ප්‍රමිති 734 ඇම්පියර 13 පේනු, කෙවෙනි පිටවාන් සහ ඇඩප්ටර් සහ සම්බන්ධිකාරක ඒකක සඳහා පිරිවිතර |
| 119 | 8544.42.91<br>8544.49.20<br>8544.49.30 | ජාත්‍යන්තර විද්‍යුත් තාක්ෂණ කොමිසම (IEC) විසින් නිර්වචනය කරන ලද G වර්ගයේ ඇම්පියර 13 පේනු සහ කෙවෙනි-පිටවාන් සමග සවිකර ඇති සම්බන්ධිකාරක සහිත කේබල් රීල් | ශ්‍රී ලංකා ප්‍රමිති 1532 ගෘහස්ත හා ඒ හා සමාන අරමුණු සඳහා වූ කේබල් රීල් සඳහා පිරිවිතර |
| 120 | 8544.49.10<br>8544.30 | මෝටර් රථ සඳහා කේබල් | ශ්‍රී ලංකා ප්‍රමිති 412 මොටර් රථ සඳහා භාවිත කේබල් සඳහා ප්‍රමිති පිරිවිතර 60V සහ 600V තනි - Core කේබල් |
| 121 | 8544.49.20<br>8544.49.30<br>8544.49.40<br>8544.49.90<br>8544.60 | පීවීසී පරිවරණය කරන ලද විදුලි කේබල 600/1000V | ශ්‍රී ලංකා ප්‍රමිති 987 පීවීසී පරිවරණය කරන ලද විදුලි කේබල සඳහා ප්‍රමිති පිරිවිතර 600/1000 V |
| 122 | 8544.49.20<br>8544.49.30<br>8544.49.90 | විදුලි බලය සහ අලෝකණය සඳහා තඹ සන්නායක සහිත පී.වී.සී පරිවෘත කේබල් | ශ්‍රී ලංකා ප්‍රමිති 733 PVC පරිවරණය සහ PVC පරිවෘත විදුලි කේබල සඳහා සඳහා ප්‍රමිති පිරිවිතර (වෝල්ටීයතාව 300/500 V දක්වා) |
| 123 | 8544.49.20<br>8544.49.30<br>8544.49.90 | විදුලි ආලෝකකරණය සඳහා පීවීසී පරිවරණය කරන ලද කැවසුම් රහිත තඹ සන්නායක සහිත කේබල සහ ගෘහස්ත, කාර්යාල සහ ඒ හා සමාන පරිසරයන්හි භාවිත වන PVC පරිවරණය කරන ලද සුනම්‍ය විදුලි රැහැන් | ශ්‍රී ලංකා ප්‍රමිති 1504 වෝල්ටීයතාව 450/750 V දක්වා ඇතුළුව අඩු වෝල්ටීයතා බලශක්ති කේබල සඳහා ප්‍රමිති පිරිවිතර |
| 124 | 9603.21 | දත් බුරුසු | ශ්‍රී ලංකා ප්‍රමිති 276 දත් බුරුසු සඳහා ප්‍රමිති පිරිවිතර |
| 125 | 9609.10.30<br>9609.90 | පාට කිරීමට ගන්නා ක්‍රයෝන්ස් සහ පැස්ටල් පාට කූරු | ශ්‍රී ලංකා ප්‍රමිති 777 පාට කූරු ක්‍රයෝන්ස් සහ පැස්ටල් පාට කූරු සඳහා ප්‍රමිති පිරිවිතර |
| 126 | 9617.00.90 | රික්තක ප්ලාස්කු (උණුසුම් බෝතල්) | ශ්‍රී ලංකා ප්‍රමිති 397 රික්තක උපකරණ, පරිවරණය කරන ලද ප්ලාස්කු, භාජන සහ ජෝගු සඳහා පිරිවිතර |
| 127 | 9619.00.10 | සනීපාරක්ෂක තුවා | ශ්‍රී ලංකා ප්‍රමිති 1732 එක් වරක් පමණක් භාවිත කරන සනීපාරක්ෂක තුවා සඳහා ප්‍රමිති පිරිවිතර<br><br>ශ්‍රී ලංකා ප්‍රමිති 1749 එක් වරක් පමණක් භාවිත කරන ඉතා තුනී / හීනි සනීපාරක්ෂක තුවා සඳහා ප්‍රමිති පිරිවිතර |

**I (ආ) උපලේඛනය**

| *අනුක්‍රමික අංකය* | *II තීරුව සංයෝජිත වර්ගීකරණ සංකේතය* | *III තීරුව විෂයයන්* | *IV තීරුව ශ්‍රී ලංකා ප්‍රමිතිය* |
|---|---|---|---|
| 128 | 0713.40.11 | සම්පූර්ණ රතු පරිප්පු | ශ්‍රී ලංකා ප්‍රමිති 1573 සම්පූර්ණ රතු පරිප්පු සඳහා ප්‍රමිති පිරිවිතර |
| 129 | 0904.21.10<br>0904.22.10 | මිරිස්, කුඩුනොකල හා නොඇඹරූ | ශ්‍රී ලංකා ප්‍රමිති 1563 කුඩු නොකල හා නොඇඹරූ මිරිස් සඳහා ප්‍රමිති පිරිවිතර |
| 130 | 0909.21<br>0909.22 | කොත්තමල්ලි, කුඩු නොකල හා නොඇඹරූ | ශ්‍රී ලංකා ප්‍රමිති 1565 කුඩු නොකල හා නොඇඹරූ කොත්තමල්ලි සඳහා ප්‍රමිති පිරිවිතර |
| 131 | 1517.10.30<br>1517.10.90<br>1517.90 | මාගරින් ඇතුළු මේද තැවරුම්, සංයෝජිත මේද තැවරුම් සහ බේකරි නිෂ්පාදන සඳහා වන මේද | ශ්‍රී ලංකා ප්‍රමිති 1102 බේකරි නිෂ්පාදන සඳහා වන මේද සඳහා ප්‍රමිති පිරිවිතර |
| 132 | 2523.29.20<br>2523.29.30 | පෝට්ලන්ඩ් සංයුක්ත සිමෙන්ති | ශ්‍රී ලංකා ප්‍රමිති 1697 පෝට්ලන්ඩ් සංයුක්ත සිමෙන්ති සඳහා ප්‍රමිති පිරිවිතර |
| 133 | 3303.00.22<br>3303.00.29 | කොලෝන් | ශ්‍රී ලංකා ප්‍රමිති 1619 කොලෝන් සඳහා ප්‍රමිති පිරිවිතර |
| 134 | 3304.10 | තොල් ආලේපන | ශ්‍රී ලංකා ප්‍රමිති 1464 තොල් ආලේපන සඳහා ප්‍රමිති පිරිවිතර |
| 135 | 3304.91 | පුයර | ශ්‍රී ලංකා ප්‍රමිති 389 පුයර සඳහා ප්‍රමිති පිරිවිතර |
| 136 | 3304.99 | ළදරුවන්ගේ සමෙහි ආලේපනය කරන ක්‍රීම් සහ දියර | ශ්‍රී ලංකා ප්‍රමිති 742 ළදරුවන්ගේ සමෙහි ආලේපනය කරන ක්‍රීම් සහ දියර සඳහා ප්‍රමිති පිරිවිතර |
| 137 | 3304.99 | සමෙහි ආලේපනය කරන ක්‍රීම් සහ දියර | ශ්‍රී ලංකා ප්‍රමිති 743 සමෙහි ආලේපනය කරන ක්‍රීම් සහ දියර සඳහා ප්‍රමිති පිරිවිතර |
| 138 | 3304.99 | ළදරු තෙල් | ශ්‍රී ලංකා ප්‍රමිති 1191 ළදරු තෙල් සඳහා ප්‍රමිති පිරිවිතර |
| 139 | 3305.10 | ළදරුවන්ගේ හිස සේදීම සඳහා භාවිතා වන ෂැම්පු | ශ්‍රී ලංකා ප්‍රමිති 1342 ළදරුවන්ගේ හිස සේදීම සඳහා භාවිතා වන ෂැම්පු සඳහා ප්‍රමිති පිරිවිතර |
| 140 | 3305.10 | වැඩිහිටියන්ගේ හිස සේදීම සඳහා භාවිතා වන ෂැම්පු | ශ්‍රී ලංකා ප්‍රමිති 1346 වැඩිහිටියන්ගේ හිස සේදීම සඳහා භාවිතා වන ෂැම්පු සඳහා ප්‍රමිති පිරිවිතර |
| 141 | 3305.90 | හිස ගල්වන ක්‍රීම් | ශ්‍රී ලංකා ප්‍රමිති 611 හිස ගල්වන ක්‍රීම් සඳහා ප්‍රමිති පිරිවිතර |
| 142 | 3305.90 | හිස ගල්වන තෙල් | ශ්‍රී ලංකා ප්‍රමිති 1341 හිස ගල්වන තෙල් සඳහා ප්‍රමිති පිරිවිතර |
| 143 | 3305.90 | ද්‍රව, ජෙල් සහ ඉමල්ෂන් ආකාරයේ ඔක්සිකාරක හිස කෙස් වර්ණ ගන්වන ඩයි | ශ්‍රී ලංකා ප්‍රමිති 1439 ද්‍රව, ජෙල් සහ ඉමල්ෂන් ආකාරයේ ඔක්සිකාරක හිස කෙස් වර්ණ ගන්වන ඩයි සඳහා ප්‍රමිති පිරිවිතර |
| 144 | 3305.90 | හිස කෙස් වර්ණ ගැන්වීමේ කුඩු | ශ්‍රී ලංකා ප්‍රමිති 1440 හිස කෙස් වර්ණ ගැන්වීමේ කුඩු සඳහා ප්‍රමිති පිරිවිතර |
| 145 | 3307.10 | රැවුල බෑමේදී භාවිතා වන ක්‍රීම් | ශ්‍රී ලංකා ප්‍රමිති 796 රැවුල බෑමේදී භාවිතා වන ක්‍රීම් සඳහා ප්‍රමිති පිරිවිතර |
| 146 | 3401.11.30<br>3401.11.90 | රැවුල බෑමේදී භාවිතා වන සබන් | ශ්‍රී ලංකා ප්‍රමිති 36 රැවුල බෑමේදී භාවිතා වන සබන් සඳහා ප්‍රමිති පිරිවිතර |

| අනුක්‍රමික අංකය | II තීරුව සංයෝජිත වර්ගීකරණ සංකේතය | III තීරුව විෂයයන් | IV තීරුව ශ්‍රී ලංකා ප්‍රමිතිය |
|---|---|---|---|
| 147 | 3401.11.30<br>3401.11.90 | මෘදු සබන් | ශ්‍රී ලංකා ප්‍රමිති 37 මෘදු සබන් සඳහා ප්‍රමිති පිරිවිතර |
| 148 | 3401.19.30<br>3401.19.90 | කාබොලික සබන් | ශ්‍රී ලංකා ප්‍රමිති 35 කාබොලික සබන් සඳහා ප්‍රමිති පිරිවිතර |
| 149 | 3401.20.90 | දියර සබන් | ශ්‍රී ලංකා ප්‍රමිති 1142 ඇඟ ගල්වන දියර සබන් සඳහා ප්‍රමිති පිරිවිතර |
| 150 | 3401.20.90 | ගෘහස්ථ හා කාර්මික කටයුතු සඳහා භාවිතා කරන දියර සබන් | ශ්‍රී ලංකා ප්‍රමිති 1390 ගෘහස්ථ හා කාර්මික කටයුතු සඳහා භාවිතා කරන දියර සබන් සඳහා ප්‍රමිති පිරිවිතර |
| 151 | 3924.90.90 | ළදරු ආහාර ලබා දීම සඳහා ප්ලාස්ටික් ද්‍රව්‍ය වලින් සාදන ලද බෝතල් | ශ්‍රී ලංකා ප්‍රමිති 1306 ළදරු ආහාර ලබා දීම සඳහා ප්ලාස්ටික් ද්‍රව්‍ය වලින් සාදන ලද බෝතල් සඳහා ප්‍රමිති පිරිවිතර |
| 152 | 3924.90.90 | බීමට ගන්නා දියර රැගෙන යන නැවත භාවිත කළ හැකි ප්ලාස්ටික් බෝතල් | ශ්‍රී ලංකා ප්‍රමිති 1616 බීමට ගන්නා දියර රැගෙන යන නැවත භාවිත කළ හැකි ප්ලාස්ටික් බෝතල් සඳහා ප්‍රමිති පිරිවිතර |
| 153 | 7321.11 | ද්‍රවීකෘත පෙට්‍රෝලියම් වායුව සමග භාවිත කරන ගෘහස්ථ අඩු පීඩන ගෑස් උඳුන් | ශ්‍රී ලංකා ප්‍රමිති 451 ද්‍රවීකෘත පෙට්‍රෝලියම් වායුව සමග භාවිත කරන ගෘහස්ථ අඩු පීඩන ගෑස් උඳුන් සඳහා ප්‍රමිති පිරිවිතර |
| 154 | 8507.10.10<br>8507.10.90 | යතුරුපැදි සහ ඒ හා සමාන භාවිත සඳහා ඊයම් අම්ල ආරම්භක විද්‍යුත් කෝෂ | ශ්‍රී ලංකා ප්‍රමිති 1235 යතුරුපැදි සහ ඒ හා සමාන භාවිත සඳහා ඊයම් අම්ල ආරම්භක විද්‍යුත් කෝෂ සඳහා ප්‍රමිති පිරිවිතර |
| 155 | 8516.40 | ගෘහාශ්‍රිත හෝ ඒ හා සමාන භාවිත සඳහා විදුලි ස්ත්‍රික්ක | ශ්‍රී ලංකා ප්‍රමිති 1476 ගෘහාශ්‍රිත හෝ ඒ හා සමාන භාවිත සඳහා විදුලි ස්ත්‍රික්ක සඳහා ප්‍රමිති පිරිවිතර |
| 156 | 8516.60.10 | විදුලි සහල් උඳුන් | ශ්‍රී ලංකා ප්‍රමිති 1501 ද්‍රව උණුසුම් කිරීම සඳහා භාවිත විදුලි උපකරණ (සහල් උඳුන්) සඳහා ප්‍රමිති පිරිවිතර |
| 157 | 8536.20 | ගෘහ හා සමාන භාවිත සඳහා ශේෂ ධාරා පරිපථ බිඳින (RCCB)- F සහ B වර්ග | ශ්‍රී ලංකා ප්‍රමිති 1431 ගෘහ හා සමාන භාවිත සඳහා ශේෂ ධාරා පරිපථ බිඳින (RCCB)- F සහ B වර්ග සඳහා ප්‍රමිති පිරිවිතර |
| 158 | 8536.61.90 | එඩිසන් ඉස්කුරුප්පු ආකාරයේ ලාම්පු රඳවනයන් | ශ්‍රී ලංකා ප්‍රමිති 1571 එඩිසන් ඉස්කුරුප්පු ආකාරයේ ලාම්පු රඳවනයන් සඳහා ප්‍රමිති පිරිවිතර |
| 159 | 8539.52 | සාමාන්‍ය ආලෝක කරණ සේවාවන් සඳහා ආලෝක විමෝචක ඩයෝඩ (LED) ලාම්පු | ශ්‍රී ලංකා ප්‍රමිති 1458 සාමාන්‍ය ආලෝකකරණ සේවාවන් සඳහා ආලෝක විමෝචක ඩයෝඩ (LED) ලාම්පු සඳහා ප්‍රමිති පිරිවිතර |
| 160 | 8544.20.10 | රූපවාහිනී ප්‍රතිග්‍රහනය සඳහා ගුවන් විදුලි සංඛ්‍යාත රැහැන් | ශ්‍රී ලංකා ප්‍රමිති 1513 රූපවාහිනී ප්‍රතිග්‍රහනය සඳහා ගුවන් විදුලි සංඛ්‍යාත රැහැන් සඳහා ප්‍රමිති පිරිවිතර |
| 161 | 9503.00.10<br>9503.00.20<br>9503.00.30<br>9503.00.40<br>9503.00.50<br>9503.00.60<br>9503.00.70<br>9503.00.80<br>9503.00.90 | සෙල්ලම් බඩු | ශ්‍රී ලංකා ප්‍රමිති අයි. එස්. ඕ 8124 - 3 වන කොටස සෙල්ලම් බඩුවල ආරක්ෂාව - ඇතැම් මූලද්‍රව්‍ය සංක්‍රමණය වීම. |

EOG 05-0174

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.